යොමුව /2019/ 06

LOLC FINANCE

එල්.ඕ.එල්.සී ෆිනෑන්ස් පී. එල්. සී ආයතනයේ ස්ථාවර තැන්පතු හා ඉතුරුම් සම්බන්ධයෙන් එහි ගනුදෙනුකරුවන්ට අදාළ වන කොන්දේසි හා නියමයන්ගෙන් මෙම ලේඛනය සමන්විත වේ. කුමන හෝ අවස්ථාවක දී, මෙහි ප්‍රකාශිත කවර හෝ නියමයක්, කොන්දේසියක්, ගාස්තුවක් හෝ අයකිරීමක් සංශෝධනය කිරීම, ඉවත්කිරීම, අළුතින් එක්කිරීම සම්බන්ධයෙන් වන අයිතිය සමාගම සතු වේ. නවතම කොන්දේසි හා නියමයන් සඳහා අපගේ වෙබ් අඩවිය (www.lolcfinance.com) වෙත පිවිසෙන්න.

## අගය එකතුකළ සේවාවන් සම්බන්ධයෙන් වන නියමයන් හා කොන්දේසි

මාගේ/අපගේ ඉල්ලීම පරිදි මා/අප විසින් ඉහතින් අනුසන් කරනු ලැබූ අගය එකතුකළ සේවාවන් මා හට/අපහට එල්.ඕ.එල්.සී ෆිනෑන්ස් පී. එල්.සී ආයතනය විසින් ලබාදීම සැලකිල්ලට ලක් කරමින් පහතින් දැක්වෙන නියමයන්, කොන්දේසි හා හානිපූරණයන්ගෙන් බැඳෙන බවට මම/අපි එකඟ වෙමි./වෙමු.

### අ. පොදු කොන්දේසි

1. මෙහි සඳහන් සේවාවන් පෞද්ගලික භාවිතය සඳහා පමණක් වන අතර මෙහි දැක්වෙන සේවාවන් හරහා ක්‍රියාත්මක කෙරෙන, බලාත්මක කෙරෙන සියලු ගනුදෙනු සම්බන්ධයෙන් සම්පූර්ණ වගකීම දැරීමට හා ඍජුව හෝ වක්‍රව හෝ ලබාදෙනු ලබන සේවාවන් සම්බන්ධයෙන් හෝ ඒ නිසාවෙන් ඇතිවන සියලු හිමිකම්, ඉල්ලීම් හා හානි සම්බන්ධයෙන් එල්.ඕ.එෆ්.සී කාර්යමණ්ඩලය, එහි අධ්‍යක්ෂවරුන් හා සේවක මණ්ඩලය නිදහස් වන බවට එකඟවෙමි/ එකඟවෙමු. උපරිම නෛතික බලසීමාවට අනුව කිසිදු අවස්ථාවකදී කවර හෝ තත්ත්වයක් යටතේ ඍජුව හෝ වක්‍රව සිදුවන පාඩු/හානි සම්බන්ධයෙන් එල්.ඕ.එෆ්.සී ආයතනය මා හට/අපහට හෝ කිසිදු තුන්වන පාර්ශ්වයකට වගකිවයුතු හෝ වගවියයුතු නොවේ.

2. මා/අප වයස 18 ඉක්මවූවන් වන අතර ලියාපදිංචියේදී ලබා දී ඇති තොරතුරු සම්පූර්ණ හා නිරවද්‍ය වේ. පෞද්ගලික තොරතුරු යාවත්කාලීන කරමින් මේ සම්බන්ධයෙන් වන කුමන හෝ වෙනස්වීමක් එල්.ඕ.එෆ්.සී ආයතනය වෙත එසැණින් දැනුම්දීමට මම/අපි පොරොන්දු වෙමි/ පොරොන්දු වෙමු.

3. ශ්‍රී ලංකා රජය විසින් හෝ අදාළ බලධාරීන් විසින් කලින් කලට පනවනු ලබන නීති, රීති හා නියමයන්ට මෙම සේවාවන්හි භාවිතය යටත්වනවා සේම තවද, එල්.ඕ.එෆ්.සී ආයතනයෙහි දැනට පවතින රීති හා රෙගුලාසි සහ/හෝ එම සේවාවන් සහ /හෝ පහසුකම් සහ /හෝ ගනුදෙනු පාලනය කරන කවර හෝ නියමයකට හෝ කොන්දේසියකට ද යටත්ය.

*4.* බද්ධ ගිණුම් හිමියන් වෙනත් කරුණු අතර මෙම නීතිරීති හා කොන්දේසිවලින් එක්ව හා වෙන්වෙන්ව බැඳී සිටින බවටද, උපදෙස් ලබා දී ඇත්තේ බද්ධ ගිණුම් හිමියන් එක් අයෙක් හෝ වැඩි ගණනක් විසින් ද යන්න නොතකා මෙම පහසුකම භාවිතා කරමින් සිදුකරන සියලුම ගනුදෙනු සඳහා එක්ව හා වෙන්වෙන්ව වගකිව යුතු බවටද මෙහි දැක්වෙන කොන්දේසිවලින් මා/අප/අපගේ අනුප්‍රාප්තිකයින්/උරුමක්කාර/පොල්මඃකාර/අද්මිනිස්ත්‍රාකාර හෝ අවසරලත් පැවරුම්ලාභීන් යන අයද අදාළ පරිදි බැඳී සිටින බවටද මම/අපි එකඟවෙමි/ එකඟවෙමු.

5. මා වෙත /අප වෙත සිදු කෙරෙන පූර්ව දැනුම්දීමකින් තොරවම හෝ හේතු දැක්වීමකින් තොරවම සේවාවන් අවලංගු කිරීම, ඉවත්කර ගැනීම හෝ අවසන් කිරීම සම්බන්ධයෙන් වන සම්පූර්ණ අවසරය එල්. ඕ.එෆ්.සී ආයතනය සතුය.

6. මා වෙත/ අප වෙත ලැබෙන සෑම තොරතුරකම රහස්‍යභාවය සහතික කිරීමට එකඟ වන අතර තවද, එම තොරතුරු කුමන හෝ තෙවන පාර්ශ්වයක් වෙත ලැබීම, කියවනු ලැබීම හෝ දැකීම සම්බන්ධයෙන් උද්ගත වන කවර හෝ ගැටළුවක් සම්බන්ධයෙන් එල්.ඕ.එෆ්.සී ආයතනය වගනොකියන බවට එකඟවෙමි./ එකඟවෙමු.

7.මෙම සේවාවන්ගෙන් කුමන හෝ සේවාවක්/සියලු සේවාවන් අවසන් කිරීමට මා/අප තීරණය කර ඇති අවස්ථාවක දී ඒ සම්බන්ධයෙන් සිදුකරන ලිඛිත ඉල්ලීමක් මගින් එල්.ඕ.එෆ්.සී ආයතනය දැනුවත් කිරීමට මා/අප විසින් කටයුතුකරනු ලබනු ඇත.

8. ලබාදෙනු ලබන සේවාවන් සඳහා ගාස්තුවක් පැනවීමට/එම ගාස්තු සහ වෙනත් අයකිරීම් වෙනස් කිරීමේ/නව්‍යකරණය කිරීමේ පූර්ණ අභිමථානුසාරී බලය සහ මා විසින්/ අප විසින් නම් කරන ලද හෝ කුමන හෝ එල්.ඕ.එෆ්.සී ශාඛාවක පවතින  මාගේ /අපගේ ගිණුමෙන්/ගිණුම්වලින් හර කිරීමේ අයිතිය එල්.ඕ.එෆ්.සී ආයතනය සතුවේ.

9. එල්.ඕ.එෆ්.සී ආයතනය, සේවාවන් සම්බන්ධයෙන් මා සමඟ /අප සමඟ විද්‍යුත් සන්නිවේදන ක්‍රමවේදයක් ඔස්සේ සන්නිවේදන කටයුතු සිදුකරනු ඇත. මා/අප විසින් එල්.ඕ.එෆ්.සී ආයතනය වෙත ලබා දී ඇති සන්නිවේදන ක්‍රමවේදය (ඊ මේල් , කෙටි පණිවුඩ සේවාව) අනුව විද්‍යුත් සන්නිවේදන ක්‍රමවේදයක් හරහා පණිවුඩයක්  යොමු කිරීමෙන් මගින් මා වෙත/ අප වෙත එම පණිවුඩය ලැබී ඇතැයි සළකනු ලැබේ.

10.ඕනෑම අවස්ථාවක දී, මා වෙත/ අප වෙත සිදුකරන දැනුම්දීමකින් අනතුරුව මෙම නියමයන් හා කොන්දේසි සම්බන්ධයෙන් කුමන හෝ සංශෝධනයක් , අතිරේක එකතු කිරීමක් හෝ වෙනස් කිරීමක් සිදු කිරීමට පරම අයිතිය එල්.ඕ.එෆ්.සී ආයතනය සතුවන අතර එම සංශෝධන, අතිරේක එකතුකිරීම්, වෙනස්කිරීම් සම්බන්ධයෙන් මා/අප බැඳී සිටිනු ඇත.

11. මවිසින්/ අප විසින් සිදු කරන ලද සියලුම ගනුදෙනු සම්බන්ධයෙන් වන එල්.ඕ.එෆ්.සී ආයතනයෙහි ලේඛන හා ප්‍රකාශන අවසානාත්මක ලේඛන හා ප්‍රකාශන වශයෙන් මා/ අප පිළිගන්නා අතර සියලු කාරණාවන් සම්බන්ධයෙන් මා/අප බැඳී සිටින්නා සේම මෙහි සඳහන් සේවාවන් හරහා මා විසින් සිදු කරන ලද කවර හෝ මුදල් ගැනීමක්/ මුදල් යැවීමක් යනාදී ගෙවීම් කටයුතු සම්බන්ධයෙන් මාගේ/අපගේ ගිණුමෙන් හර කර ගැනීමට මම /අපි එකඟවෙමි/එකඟවෙමු.

12. මෙම කොන්දේසි හා නියමයන් සම්බන්ධයෙන් උද්ගත වන කවර හෝ  නොසීහුමක් සම්බන්ධයෙන් ශ්‍රී ලාංකීය නීති පද්ධතිය  හා අධිකරණයන් විසින් සිදු කරන අර්ථවිග්‍රහකිරීම්  අනුව කටයුතු සිදු කරනු ඇති අතර ඒ සම්බන්ධයෙන්  උද්ගත වන ගැටළු නිරාකරණය සඳහා  පූර්ණ අධිකරණ බලය එම ආයතනයන්ට හිමිවනු ඇත.

### ආ. ස්වයංක්‍රීය ටෙලර් කාඩ්පත (ATM)/හර කාඩ්පත (Debit Card)

1. එල්.ඕ.එෆ්. සී හර කාඩ්පත සෑම අවස්ථාවකදී ම එල්.ඕ.එල්.සී ෆිනෑන්ස් පී. එල්. සී ආයතනයෙහි දේපළක් වශයෙන් පවතින අතර එල්.ඕ.එෆ්. සී හි ඉල්ලීම මත කොන්දේසි විරහිතව කාඩ්පත වහාම එහි භාරයට ගනු ඇත.

2. මාගේ/අපගේ පෞද්ගලික අනන්‍යතා අංකය /රහස් අංකය (PIN) ඉතා රහස්‍ය ලෙස තබාගන්නා  අතර කවර හෝ තත්ත්වයක් යටතේ, කුමන හෝ වේලාවක ,කිසිදු පුද්ගලයෙකු වෙත එම අංකය ලබා නොදීමට වගබලාගනිමි./ වගබලාගනිමු. "එල්.ඕ.එෆ්.සී හර කාඩ්පත් රහස් අංකය" යන්නෙන් එල්.ඕ.එෆ්.සී ආයතනය විසින් මා වෙනුවෙන් /අප වෙනුවෙන් රහස්‍ය ලෙස සකසා ඇති සහ මා විසින් සිදු කර ඇති ආදේශනයන් ද සහිත පෞද්ගලික අනන්‍යතා අංකය යන්න අදහස් වේ.

3. මා වෙත/අප වෙත ලැබී ඇති එල්.ඕ.එෆ්.සී හර කාඩ්පත/හර කාඩ්පත් සොරකම් කළ හෝ නැතිවූ අවස්ථාවක දී ඒ බැව් කොමර්ෂල් බැංකුව/හැටන් නැෂනල් බැංකුව/ එල්.ඕ.එෆ්.සී වෙත වහාම දැන්විය යුතු අතර නැතිවූ, සොරකම් කරන ලද එල්.ඕ.එෆ්.සී ණය කාඩ්පතක් මාගේ/ අපගේ අධිකාරී බලය රහිතව භාවිත වීමෙන් උද්ගත වන කවර හෝ පාඩුවක් සම්බන්ධයෙන් එල්.ඕ.එල්.සී ආයතනය වගවීමකට ලක් නොකිරීමට මම/අපි ක්‍රියා කරන්නෙමි./ක්‍රියා කරන්නෙමු.

4. එල්.ඕ.එෆ්.සී ජාලය ඇතුළුව කුමන හෝ දේශීය ජාලකරණ පද්ධතියක් හරහා සිදු කරන ගනුදෙනුවලට සම්බන්ධ සියලු ගාස්තු සහ එල්.ඕ.එෆ්.සී හර කාඩ්පත/හර කාඩ්පත් භාවිතයට අදාළව ගෙවිය යුතු නෛතික ගාස්තු හෝ වෙනත් ව්‍යවස්ථාපිත ගාසතුවක් ඇතුළත් වෙනත් වගවීම් සම්බන්ධයෙන් වන ගාස්තු අදාළ පරිදි මාගේ/අපගේ එල්.ඕ.එෆ්.සී ගිණුමෙන් හර කිරීමට අවසර දෙන්නෙමි/ අවසර දෙන්නෙමු.

05. මා වෙත/අප වෙත සිදු කරන පූර්ණ දැනුම්දීමකින් හෝ හේතු දැක්වීමකින් තොරව එල්.ඕ.එෆ්.සී හර කාඩ්පත අවලංගු කිරීම, අස් කර ගැනීම හෝ අලුත් කිරීමේ සම්පූර්ණ බලතල එල්.ඕ.එෆ්.සී ආයතනය සතුය. එල්.ඕ.එල්.සී හර කාඩ්පත අවසන් කිරීමට මා/අප තීරණය කර ඇති අවස්ථාවක දී, දින 7 කට නොඅඩු පූර්ව ලිඛිත දැනුම්දීමකින් අනතුරුව එල්.ඕ.එල්. සී හර කාඩ්පත වහාම භාරදීමට කටයුතු කළ යුතුය.

06. එල්.ඕ.එෆ්.සී හර කාඩ්පතට සිදුකෙරෙන සියලු ප්‍රතිස්ථාපනයන් හා අලුත්කිරීම් දැනට බලාත්මක වන කොන්දේසි හා නියමයන්ට යටත් වේ.

07. කෙසේවුවද, කුමන හෝ හේතුවක් නිසා කාඩ්පත අගරුවීම සම්බන්ධයෙන් එල්. ඕ.එෆ්.සී/කොමර්ෂල් බැංකුව/හැටන් නැෂනල් බැංකුව වගකිවයුතු නොවන අතර කාඩ්පත භාවිත කිරීමේ අවධානම මා /අප තනිව භාරගන්නා අතර කාඩ්පත භාවිතයෙන් එයට ආනුෂංගිකව හෝ එය භාවිත කිරීම තුළින් ඇතිවන සියලු අවධානම් මම/අපි භාරගනිමි/භාරගනිමු.

08. නිශ්චල දේපළ, මූල්‍ය වත්කම් හෝ වාණිජමය වටිනාකම් සහිත භාණ්ඩ මිලදී ගැනීම සඳහා සහ ශ්‍රී ලංකාවෙන් පිටතට ප්‍රාග්ධනය මාරුකිරීම් සඳහා විදේශයන්හි දී එල්.ඕ.එල්.සී හර කාඩ්පත භාවිත නොකිරීමට මම/අපි එකඟවෙමි/එකඟවෙමු. ශ්‍රී ලංකා රුපියල් හැරුණු කොට ශ්‍රී ලංකා රුපියල් බවට පත්කර ගිණුමෙන් හරකරන වෙනත් ව්‍යවහාර මුදල් වර්ගයකින් සිදුකරන සියලුම ගාස්තු සඳහා සහ කාඩ්පතෙන් සිදුකළ/මා වෙත නිකුත් කළ ඇති ගෙවීම් සඳහා ගෙවිය යුතු වෙනත් වියදම්/ ගාස්තු සඳහා වගකීමට බැඳීමට මෙන්ම ඒ සම්බන්ධයෙන් කුමන හෝ අලාභයක් උද්ගතවුවහොත් එය හානිපූරණය කිරීමට මම/අපි එකඟවෙමි/එකඟවෙමු.

## ඇ. කෙටි පණිවුඩ සංඥා (එස්.එම්.එස් ඇලර්ට්ස්) /ඊ-මේල් පණිවුඩ /ඩයලොග් ටොප් අප්

1. එල්. ඕ.එෆ්.සී ආයතනය විසින් ඉහත සඳහන් සන්නිවේදන මාධ්‍යයන්ගෙන් පණිවුඩයක් මා වෙත එවීමෙන් එම පණිවුඩය මාහට ලැබුණු බවට සැළකේ.

2. මෙම සේවාවන්හි කිසියම් අක්‍රමිකතාවයක් හෝ අසමත්වීමක් හේතුවෙන් පැනනගින අලාභයක් හෝ හානියක් සම්බන්ධයෙන් එල්. ඕ.එෆ්.සී ආයතනය කිසිදු ආකාරයකින් වගවිය යුතු හෝ වගකිවයුතු හෝ වගකීමක් දැරිය යුතු නොවේ.

3. මෙම සේවාවන් සැපයීම සඳහා එල්. ඕ.එෆ්.සී ආයතනය විසින් කලින් කලට ඉල්ලා සිටිනු ලබන සියලු තොරතුරු මම/අපි ඉදිරිපත් කරන්නෙමි./ ඉදිරිපත් කරන්නෙමු. මා/අප විසින් දැනටමත් එල්.ඕ.එල්.සී වෙත ලබා දී ඇති විස්තර හා ලේඛන මත පදනම්ව එල්. ඕ.එෆ්.සී ආයතනය ක්‍රියාකරන බැව් මම/අපි අවබෝධ කර ඇති අතර මාගේ /අපගේ පාර්ශ්වයෙන් සිදුවන කිසිදු වැරදි අර්ථ නිරූපණයක් සම්බන්ධයෙන් එල්. ඕ.එෆ්.සී ආයතනය වගකිවයුතු නොවේ.

4. මා විසින්/අප විසින් මාගේ/අපගේ ජංගම දුරකථන අංකය/ඊ-මේල් ලිපිනය වෙනස් කළ අවස්ථාවකදී, එල්. ඕ.එෆ්.සී ආයතනය වෙත එසැණින් දැනුම්දීමට මා/අප විසින් ක්‍රියාකරන අතර එසේ කිරීමට මා/ අප අපොහොසත් වුවහොත් ඒ සම්බන්ධයෙන් එල්. ඕ.එෆ්.සී ආයතනය වගකිවයුතු නොවන බවට මම/අපි එකඟවෙමි/එකඟවෙමු.

5.මාගේ/ අපගේ ජංගම දුරකථනය නැතිවූ අවස්ථාවකදී හෝ/තෙවන පාර්ශ්වයක ක්‍රියාකාරකමක් සම්බන්ධයෙන් සැකයක් මතු වූ විට ඒ පිළිබඳව එල්. ඕ.එෆ්.සී ආයතනය වෙත දැනුම්දීමට මා ක්‍රියාකරන අතර එල්. ඕ.එෆ්.සී ආයතනය විසින් අවශ්‍යයැයි සැළකෙන අවස්ථාවන්හිදී ඉහතින් දක්වන ලද සේවාවන් අවසන් කිරීමට/අක්‍රීය කිරීමට කටයුතු කිරීම සම්බන්ධයෙන් මම/අපි එකඟවෙමි/එකඟවෙමු. එමෙන්ම, එසේ කිරීමට මා/ අප අපොහොසත් වුවහොත් ඒ සම්බන්ධයෙන් එල්. ඕ.එෆ්.සී ආයතනය වගකිවයුතු නොවන බවට මම/අපි එකඟවෙමි/එකඟවෙමු.

6. විද්‍යුත් සම්ප්‍රේෂණවලට ආවේණික ගති ලක්ෂණ හේතුවෙන් එල්.ඕ.එෆ්.සී ඉතිරිකිරීම් ගිණුම් කෙටි පණිවුඩ, ඊ-මේල් පණිවුඩ සහ ඩයලොග් ටොප් අප් සේවාවන් හරහා දත්ත සම්ප්‍රේෂණය කිරීම දෝෂ රහිතයැයි සහතික කළ නොහැකි බැව් මම/අපි අවබෝධකර ගන්නා සේම එය පිළිගනිමි/පිළිගනිමු. මෙම සේවාව ලබාදිය හැකිවීම පදනම් කරගනිමින් පවත්වාගෙන යන සේවාවක් වන අතර කිසිදු අවස්ථාවකදී කුමන හෝ හේතුවක් නිසාවෙන් කවර හෝ වේලාවකදී නැතහොත් කලින් කලට සිදුවන සේවා බිඳවැටීමක් හෝ සේවාවන් ලබාගත නොහැකිවන අවස්ථා හෝ සේවාවන් භාවිත කිරීමේදී උද්ගත වන අන්තර්ජාල බිඳවැටීම්, දත්ත විනාශවීම්, දත්ත සම්ප්‍රේෂණ දෝෂ හෝ හානිසිදුවීම ඇතුළුව සේවාව භාවිතය නිසා මා හට /අපහට අත්විඳීමට හෝ දැරීමට සිදුවන අලාභ, හානි හෝ අපහසුතාවයන් සම්බන්ධයෙන් එල්. ඕ.එෆ්.සී ආයතනය වගවිය යුතු හෝ වගකිව යුතු නැති බැව් මම /අපි පිළිගන්නා අතර එකඟවෙමි./එකඟවෙමු.

7. ලියාපදිංචි ජංගම දුරකථනයේ කිසියම් තාක්ෂණික හෝ වෙනත් අඩුපාඩුවක් හේතුවෙන් සහ හෝ ජංගම දුරකථනය හෝ විද්‍යුත් තැපැල ලිපිනය විසන්ධිවීම යනාදී මෙම සේවාවන් භාවිතයෙන් මා ස්වයංක්‍රීයව ඉවත්කරනු ලබන කුමන හෝ හේතුවක් නිසා ඇතිවන සේවාවන් ලබාගත නොහැකි තත්ත්වයන් සම්බන්ධයෙන් එල්. ඕ.එෆ්.සී ආයතනය වගවිය යුතු හෝ වගකිව යුතු නැති බවත් මම /අපි පිළිගන්නා අතර එකඟවෙමි./එකඟවෙමු.

**ඈ. එල්. ඕ.එල්.සී රියල් ටයිම්/ එල්. ඕ.එල්.සී රියල් ටයිම් ඇප්**

1. මෙම පහසුකම ලබාදෙන්නේ දැනට සිටින එල්. ඕ.එෆ්.සී පාරිභෝගිකයින්ට පමණක් බවත් පළමුවන අයදුම්කරු පමණක් මෙම සේවාව ලැබීමට හිමිකම් කියන බවත් දෙවන හෝ තුන්වන අයදුම්කරුවන් හෝ ඒකාබද්ධ ගිණුම් මෙම සේවාව සඳහා සුදුසුකම් නොලබන බවත් මා/අප අවබෝධ කරගෙන සිටින අතර මෙම පහසුකම පළමුවන අයදුම්කරුට පමණක් ලබාදීමට මම/අපි එල්. ඕ.එෆ්.සී ආයතනය වෙත බලය පවරමු.

2. පළමුවන අයදුම්කරු විසින් එල්. ඕ.එල්.සී රියල් ටයිම් පහසුකම හරහා එල්. ඕ.එෆ්.සී වෙත ලබාදෙන කුමන හෝ උපදෙසක් හෝ පණිවුඩයක් හා මා වෙත/අප වෙත නිකුත්කර ඇති මුරපදය/මුරපදවලින් හෝ පළමුවන අයදුම්කරු විසින් ලබා දී ඇති ජෛවමිතික (බයෝමෙට්‍රික්ස් )තොරතුරුවලින් සමන්විත පරිශීලක තොරතුරු පත්‍රිකාවල සඳහන් කර තිබෙන පරිදි (තිබේ නම්)සහතික කර ඇත්නම් ඒවා පිළිගැනීමට හා ඒ අනුව කටයුතු කිරීමට මම/අපි අවසර ලබාදෙමි/ලබාදෙමු.(මුරපදය ලෙස අදහස් වන්නේ එල්. ඕ.එෆ්.සී විසින් රහසිගත ලෙස සකස්කර ඇති මුල් මුරපදය වන අතර Biometrics (බයෝමෙට්‍රික්ස්) යන්නෙන් අදහස් වන්නේ ඔබගේ ජංගම දුරකථනයේ ස්ථාපනය කර ඇති (බයෝමෙට්‍රික්ස්) යන ජීවමිතික විශේෂාංගයයි.

3. එල්. ඕ.එල්.සී රියල් ටයිම් පහසුකම භාවිත කිරීමට අවශ්‍ය වන පාරිභෝගික පරිශීලක නාමය/මුරපදය (මුරපද) කුමන හෝ පුද්ගලයෙකුහට කිසිදු අවස්ථාවක දී කුමන හෝ තත්ත්වයක් මත හෙළිදරව් නොකරන අතර එම තොරතුරු සම්බන්ධයෙන් දැඩි සේ රහස්‍ය ලෙස කටයුතු කරමි/ කටයුතු කරමු.

4. පාරිභෝගික පරිශීලක නාමයන්/මුරපදය/මුරපද කුමන හෝ අනවසර පාර්ශ්වයක් අතට පත්ව ඇති බැව් හෝ ජංගම උපාංගය සොරකම් කර ඇති බවට දැනගත් වහාම ඒ සම්බන්ධයෙන් එල්.ඕ.එෆ්.සී ආයතනය දැනුවත් කරන්නෙමි/කරන්නෙමු.

5. මා විසින් /අප විසින් ලබාදෙනු ලබන උපදෙස් මා වෙතින්/අප වෙතින් ලැබෙන ඒවා නොවන ලෙසට එල්.ඕ.එෆ්.සී ආයතනය තනි අභිමතයක සිටින්නේ නම් මා/අප ලබාදෙන උපදෙස් අනුව ක්‍රියා කිරීමට එල්.ඕ.එෆ්.සී ආයතනය බැඳී නොසිටින බවට මම/අපි එකඟවෙමි/එකඟවෙමු,

6. එල්.ඕ.එල්.සී රියල් ටයිම් පහසුකම හරහා ලබාදෙන උපදෙස් සම්බන්ධයෙන් වැඩිදුර විමර්ශනයන් සිදු කිරීමට එල්.ඕ.එෆ්.සී ආයතනය බැඳී නොසිටින බවට මම අප පිළිගන්නා අතර ලබාදෙන උපදෙස් වෙනස් කළ නොහැකි බවට හා මා/ අප ඒවායෙන් බැඳී සිටින බවට එකඟ වෙමි/එකඟවෙමු.

7.මාගේ/ අපගේ ගිණුමේ/ගිණුම්වල ප්‍රමාණවත් තරම් අරමුදල් නොමැත්තේ නම් ,එල්.ඕ.එල්.සී රියල් ටයිම් පහසුකම හරහා සිදුකරන ගනුදෙනු සිදු කිරීමට උත්සාහ නොදරන බවට මම/අපි එකඟවෙමි/එකඟවෙමු. අනාගත දිනයක් සම්බන්ධයෙන් සැලසුම්කර ඇති ගනුදෙනු එල්.ඕ.එෆ්.සී ආයතනය විසින් ක්‍රියාත්මක

කරනු ලබන්නේ අදාළ දිනය/දිනයන් වනවිට ගිණුමේ ප්‍රමාණවත් අරමුදල් තිබේනම් පමණක් වන අතර ගෙවීම් උපදෙස් ලැබෙන කාලය වනවිට හෝ එම ගෙවීම් සිදුකළ යුතු කාලයේදී ගිණුමේ ප්‍රමාණවත් අරමුදල් තිබේනම් මිස ගෙවීම් උපදෙස් ලබාදීමට එල්.ඕ.එෆ්.සී ආයතනය වගකීමට නොබැඳෙන බවටද තවදුරටත් එකඟවෙමි/එකඟවෙමු.

8. එල්.ඕ.එල්.සී රියල් ටයිම් පහසුකම සෑම විටෙකදීම දෝෂවලින් තොර, මාගේ /අපගේ අවශ්‍යතා සමඟ ගැළපෙන බවට වගනොකියනු බැව් මම/අපි අවබෝධකරමි./අවබෝධ කරමු.

9. එල්. ඕ.එෆ්. සී ආයතනය විසින් ඇතැම් විටෙක දී එල්.ඕ.එල්.සී රියල් ටයිම් පහසුකම සීමා කිරීමක් හෝ අළුත්වැඩියා කිරීම, නඩත්තු කටයුතු හෝ නවතම විශේෂාංග හඳුන්වාදීම සඳහා එම පහසුකම මුළුමනින්ම නවතාදැමීමක් සිදුකළ හැකි අතර මාස දෙකකට පෙර පූර්වයෙන් සිදුකරන ලිඛිත දැනුම්දීමක් මඟින් මාර්ගගත ගිණුමක් වසා දැමීමේ අයිතියද එල්. ඕ.එෆ්. සී ආයතනය සතුය.

10. මා/අප විසින් ඉල්ලා සිටින ඕනෑම උපදෙසක් ක්‍රියාවට නැංවීම සඳහා එල්. ඕ.එෆ්. සී ආයතනය සැලකිය යුතු මට්ටමේ උත්සාහයක් දරණ බව මම/අපි පිළිගන්නා අතර එල්.ඕ.එෆ්.සී නිසි උත්සාහයක් ගැනීමට අපොහොසත්වීම නිසා මිස එවැනි ඉල්ලීමක් සම්බන්ධයෙන් සිදුවන අසාර්ථකත්වයක් සම්බන්ධයෙන් එල්. ඕ.එෆ්. සී ආයතනයෙහි වගවීමක් නොමැති බවට මම/අපි එකඟවෙමි/එකඟවෙමු.

11. ලබා දී ඇති උපදෙස්වල නිරවද්‍යතාව සහ සම්පූර්ණභාවය සම්බන්ධයෙන් මම/අපි වගකිවයුතු වන අතර කවර හෝ හානියක් සම්බන්ධයෙන් එල්. ඕ.එෆ්. සී ආයතනය වගකීමෙන් නිදහස් බවට ද මම/අපි එකඟවෙමි/එකඟවෙමු.

12. සිදුකරනු ලබන ගනුදෙනු සෑම අවස්ථාවකදීම ලැබෙන උපදෙස් හා සමගාමී නොවන බවට මම/අපි අවබෝධ කරමි/අවබෝධකරමු. ඇතැම් උපදෙස් ප්‍රමාද වී ලැබිය හැකි අතර සහ හෝ සේවාවන් සාමන්‍ය වැඩ වේලාවන්හිදී ලබාගත හැකිවුවද සේවා උපදෙස් සාමන්‍ය රාජකාරී වේලාවන්හිදී පමණක් ලබාගත හැකි බවටත් කවර හෝ හානියක් සම්බන්ධයෙන් එල්. ඕ.එෆ්. සී ආයතනය වගකීමෙන් නිදහස් බවට ද මම/අපි අවබෝධකරමි./අවබෝධකරමු.

13. එල්.ඕ.එල්.සී රියල් ටයිම් පහසුකමෙහි අක්‍රමවත් ක්‍රියාකාරීත්වය හෝ බිඳවැටීම හේතුවෙන් සහ මෙම මාධ්‍ය හරහා ලබාදෙන උපදෙස් සම්බන්ධයෙන් ක්‍රියා කිරීමට එල්. ඕ.එෆ්. සී ආයතනය අපොහොසත් වීම නිසා හෝ සිදුවන අලාභ හෝ හානිවලට එල්. ඕ.එෆ්. සී ආයතනය කිසිදු ආකාරයකින් වගකිව යුතු නොවන බවට මම/අපි එකඟවෙමි/එකඟවෙමු.

14. මෙහි දැක්වෙන විධිවිධානයන්හි පොදුභාවයට අනුකූල නොවුවද ඒවාට අගතියක් නොවන පරිදි එල්.ඕ.එල්.සී රියල් ටයිම් පහසුකම භාවිත කිරීමට හා එල්.ඕ.එල්.සී රියල් ටයිම් පහසුකම භාවිත කිරීම සම්බන්ධයෙන් ඇතිවන අවධානම් මා/අප විසින් තනිව දැරීමට එකඟ වන අතර එම සේවාව භාවිත කිරීමෙන් එයට ආනුෂංගිකව ඇතිවන්නාවූ හෝ එතුළින් හටගන්නාවූ සියලු අවධානම් දැරීමට මම/අපි එකඟවෙමි/එකඟවෙමු.

15. ඉතුරුම්, ස්ථාවර තැන්පතු, කල්බදු, රක්ෂණ ,ණය සහ හෝ වෙනත් ගිණුම් පහසුකම් සම්බන්ධ මෙහෙයුම් කටයුතු පරිපාලනය කරන සියලු රෙගුලාසි හා නියාමනයන් එම ගිණුම් හා සම්බන්ධ එල්.ඕ.එල්.සී රියල් ටයිම් ගනුදෙනු සම්බන්ධයෙන් අදාළ වන බවට මම/අපි පිළිගනිමි/පිළිගනිමු.

16. එල්.ඕ.එල්.සී රියල් ටයිම් පහසුකම භාවිත කරන අතරවාරයේදී ඇතුළත් කරන කුමන හෝ තොරතුරක් පූර්ව අනුමැතිය පරිදි මා සමඟ/අප සමඟ පමණක් තබාගන්නා බවට මම/අපි පිළිගනිමි./පිළිගනිමු. එල්.ඕ.එෆ්.සී විසින් සුදුසු පරිදි දත්ත එක්රැස් කිරීම ,ගබඩා කිරීම,සහ සැකසුම් පිළිවෙත් අනුගමනය කිරීම සිදුකරන අතර අනවසර ප්‍රවේශය, වෙනස්කිරීම, අනාවරණය කිරීම හෝ විනාශ කිරීමට එරෙහිව ප්‍රමාණවත් ආරක්ෂක පියවර හා පාලන කටයුතු ක්‍රියාත්මක කර ඇත.

17. පූර්ව අවසරයකින් තොරව එල්.ඕ.එල්.සී රියල් ටයිම් පහසුකම ලබාගන්නා සෑම අවස්ථාවකදීම එල්.ඕ.එෆ්.සී ආයතනය විසින් පරිශීලකයින් පිළිබඳව පෞද්ගලික නොවන හඳුනාගැනීමේ තොරතුරු එක්රැස්කරන බැව් මම/අපි දනිමි./දනිමු. පෞද්ගලික නොවන හඳුනාගැනීමේ තොරතුරු අතරටඃ බ්‍රවුසරයේ නම, පරිගණක වර්ගය, මෙහෙයුම් පද්ධතිය හා සම්බන්ධ තාක්ෂණික තොරතුරු, උපයුක්ත කර ඇති අන්තර්ජාල සේවා සපයන්නන් හා ඒ හා සමාන වෙනත් තොරතුරු ඇතුළත් වේ.

18. ආරක්ෂක අරමුණු උදෙසා එල්.ඕ.එෆ්.සී රියල් ටයිම් පහසුකම භාවිත කිරීම එල්.ඕ.එෆ්.සී ආයතනයට අධීක්ෂණය කළ හැකිබව මම/අපි දනිමි.දනිමු. තවද, එම තොරතුරු එල්.ඕ.එෆ්.සී ආයතනය විසින් ගනුදෙනු සැකසීම,ගිණුම් පරිපාලනය( දත්ත සුරක්ෂිත කිරීමේ පරමාර්ථය පෙරදැරිව පෞද්ගලික තොරතුරු සත්‍යාපනය කිරීම ඇතුළුව) සහ පැමිණිලිවලට ප්‍රතිචාර දැක්වීම සම්බන්ධයෙන් පමණක් සීමා නොවී එම තොරතුරු විවිධ පරමාර්ථයන් සඳහා යොදාගනු ඇත.

19. එල්.ඕ.එල්.සී රියල් ටයිම් පහසුකම භාවිත කිරීම සඳහා අවශ්‍ය විය හැකි උපකරණ ප්‍රමාණවත් ආරක්ෂාවකින් යුතුව මනා තත්ත්වයකින් තිබීම, එම උපකරණවලට හෝ එල්.ඕ.එල්.සී රියල් ටයිම් පහසුකමට බලපාන දෝෂ, මැල් වෙයාර් හා වෙනත් වෛරස් යනාදියෙන් ආරක්ෂා කිරීම සඳහා ක්‍රියාකිරීම මාගේ/අපගේ වගකීම බව මම/අපි අවබෝධ කර සිටිමි/සිටිමු

20. මාගේ/අපගේ එල්.ඕ.එල්.සී පහසුකම් භාවිතය පදනම් කරගනිමින් එල්. ඕ. එල්. සී විසින් වෙළඳපළ සහ වෙනත් විශ්ලෙෂණ සිදුකළ හැකි බැව් මම /අපි දනිමි/දනිමු. මෙම පහසුකම වැඩිදියුණු කරගනිමින් පරිශීලක රටා සහ හැසිරීම් හඳුනාගැනීම සඳහා එවැනි විශ්ලේෂණ සිදුකරනු ලැබේ.

21. එල්.ඕ.එල්.සී රියල් ටයිම් පහසුකම් නීත්‍යානුකූල නොවන, අනීතික හෝ තහනම් කර ඇති භූමි ප්‍රදේශයන්හි එම පහසුකම් භාවිත කිරීම සම්බන්ධයෙන් එල්.ඕ.එෆ්.සී ආයතනය කිසිඳු වගකීමක් භාර නොගන්නා වගට මම /අපි එකඟවෙමි/එකඟවෙමු. ශ්‍රී ලංකාවෙන් පිටත ස්ථානවලින් එල්.ඕ.එල්.සී රියල් ටයිම් පහසුකම භාවිත කිරීමට තීරණය කරන්නේ නම් එය ස්වකැමැත්තෙන් සිදුකළ යුතු අතර ප්‍රාදේශීය නීතිවලට අනුකූලවීම සඳහා වගකිව යුතුය.

22.එල්.ඕ.එල්.සී රියල් ටයිම් හරහා ගිණුම් විවෘත කිරීම

පළමුවැනි අයදුම්කරුහට එල්.ඕ.එල්.සී රියල් ටයිම් හරහා මාර්ගගත ගිණුම්/ස්ථාවර ගිණුම් ඕනෑම සංඛ්‍යාවක් විවෘතකළ හැකි බවටත් සියලු මාර්ගගත ගිණුම් විවෘත කිරීම සඳහා පළමුවන අයදුම්කරුගේ පවත්නා විස්තර හා ලේඛන (ගණුදෙනුකරු හඳුනාගැනීම සම්බන්ධ විස්තර හා ලේඛන (KYC පෝරම ), මැන්ඩේටයන් හා වෙනත් අදාළ ලේඛන සහ තොරතුරු ) භාවිත කරනු ඇති අතර සියලු තොරතුරු මෙම දිනය වනවිට සත්‍ය හා නිරවද්‍ය විය යුතු වන අතර එම ලේඛන හෝ විස්තර සම්බන්ධයෙන් උද්ගත වන කවර හෝ වෙනසක් සම්බන්ධව එල්.ඕ.එල්.සී ආයතනය පැය 24 ක් ඇතුළත දැනුවත් කරන බවටත් නිර්දේශිත කාල පරිච්ඡේදය තුළදී එවැනි කුමන හෝ වෙනස්කමක් සම්බන්ධයෙන් එල්.ඕ.එෆ්.සී ආයතනය දැනුවත් කළ නොහැකි වුවහොත් ඒ සම්බන්ධයෙන් එල්.ඕ.එෆ්.සී ආයතනය වගකිවයුතු නොවන බවටත් මම /අපි එකඟවෙමි/එකඟවෙමු.

23. ගිණුම් ප්‍රකාශන

ගිණුම/ගිණුම් වෙනුවෙන් විද්‍යුත් ප්‍රකාශයක් සකස් වන බවටත් මෙය මාර්ගගත ගිණුමක් වන හෙයින් ලිඛිත ප්‍රකාශයක් නිකුත් නොකරන බවටද එල්.ඕ.එල්.සී ආයතනය වෙත සිදු කරන ඉල්ලීමක් මත අදාළ ගාස්තුවලට යටත්ව විද්‍යුත් ප්‍රකාශයේ මුද්‍රිත පිටපතක් හෝ ලිඛිත ප්‍රකාශයක් ලබාගත හැකිබවත් මම/අපි දනිමි./දනිමු.

24. ගිණුම වැසීම/ආපසුගැනීම්

(අ). පළමුවැනි අයදුම්කරුට එල්.ඕ.එෆ්.සී රියල් ටයිම් හරහා ප්‍රාථමික ගිණුම/ගිණුම් හැර ඕනෑම මාර්ගගත ගිණුමක්/ගිණුම් /ස්ථාවර තැන්පතුවක් වසා දැමීමට හෝ මුදල් ආපසු ගත හැකි බැව් මම/අපි දනිමි/දනිමු.එහෙත් මේ සඳහා පළමු අයදුම්කරු විසින් ගිණුම/ස්ථාවර තැන්පතුව වැසීමේදී පවතින කුමන හෝ ශේෂයක් මාරුකිරීම සඳහා එල්.ඕ.එෆ්.සී රියල් ටයිම් පැතිකඩෙහි (profile )ගිණුමක් නම්කිරීම අවශ්‍ය වේ.

(ආ).එබඳු අවස්ථාවකදී, මාර්ගගත ගිණුමෙන් මා/අප විසින් සකසා ඇති කුමන හෝ ස්ථාවර නියෝගයක් ස්වයංක්‍රීයව අවසන් වන අතර තවද,මාර්ගගත ගිණුම වෙනුවෙන් සකසා ඇති කවර හෝ ස්ථාවර නියෝගයක් ගිණුම වැසීම හේතුවෙන් අවලංගු නොවනු ඇත.

25. පහතින් දැක්වෙන ඕනෑම තත්ත්වයක් යටතේ ගිණුම වහා අත්හිටුවීමට එල්.ඕ.එෆ්.සී ආයතනයට අයිතියක් ඇති බැව් මම/අපි අවබෝධකර සිටින අතර එබඳු කවර හෝ සිදුවීමක් ඇති වුවහොත් මා වෙත/අප වෙත එසැණින් දැනුම්දීමට පියවර ගත යුතුය.

(අ). කුමන හෝ අධිකරණයකින් මා/අප වස්තුභංගත්වයට පත්ව ඇතැයි ප්‍රකාශයට පත්කළ විට

(ආ). මා හට/අපහට එදිරිව සිදුකර ඇති පැමිණිල්ලක් සම්බන්ධයෙන් නියෝගයක් ලැබුණ විට

(ඇ). ගිණුම/ගිණුම්වලට විරුද්ධව කුමන හෝ අධිකරණ නියෝගයක් ලැබුණ විට

(ඈ). මා හෝ අප අතරින් කවර හෝ අයෙකු මියගිය විට

(ඉ). යම් විෂයාත්මක කාරණාවක් සම්බන්ධයෙන් සිදුකරන කවර හෝ ඉදිරිපත්කිරීමක්, වගකීමක් හෝ ප්‍රකාශයක් අසත්‍ය වූ විට

(ඊ). මා/අප මෙහි සඳහන් කොන්දේසි කඩකළ විටෙකදී

(උ). කුමන හෝ හේතුවක් නිසා මෙම ගිවිසුම ශූන්‍ය සහ බල රහිත භාවයට පත්වූවිට

(ඌ). එල්.ඕ.එෆ්.සී ආයතනය විසින් එහි අභිලාෂයන්ට කවර හෝ අගතියක් වේ යයි සිතන කුමන හෝ විෂයාත්මක වෙනසක් සිදුවූවිට

## ඉ. රහැන්ගත සම්ප්‍රේෂණ, ටෙලිෆෝන්, ෆැක්ස් සහ ඊමේල්

1 මාගේ/අපගේ නමින්/නම්වලින් හෝ වෙනත් පුද්ගලයෙකුගේ /පුද්ගලයින්ගේ නමින් /නම්වලින් එල්.ඕ.එෆ්.සී ආයතනය යටතේ හෝ වෙනත් ඕනෑම මූල්‍ය ආයතනයක් යටතේ නඩත්තු වන මාගේ/අපගේ කවර හෝ ගිණුමක්/ගිණුම් මඟින් සිදුකරන මුදල් ගෙවීමක් හෝ මුදල් යැවීමක් සම්බන්ධයෙන් හෝ යෝග්‍ය පොලී අනුපාතිකය, විනිමය අනුපාතිකය, හා කාල සීමාව සම්බන්ධයෙන් මාගේ /අපගේ හෝ බලයලත් නිලධාරියාගේ/නිලධාරීන්ගේ අනුමැතිය අන්තර්ගත මාගේ/අපගේ කවර හෝ ගිණුමක් හා අදාළ වන තැන්පතු, තැන්පතු සහතික ඕනෑම අවස්ථාවකදී අළුත්කිරීම, ආපසුගැනීම හා අවලංගු කිරීම හෝ යෝග්‍ය පොලී අනුපාතිකය, විනිමය අනුපාතිකය, අදාළමුදල සහ කාල සීමාව හෝ සම්බන්ධයෙන් මාගේ/අපගේ හෝ බලයලත් නිලධාරියාගේ අනුමැතිය අන්තර්ගත මගේ/අපගේ ගිණුම් හා සම්බන්ධ එල්.ඕ.එෆ්.සී නිසා ඇතිවන කුමන හෝ ණයගැතිභාවයක් නිසා තැන්පතු කාලය දිගු කිරීම හෝ නැවත ගෙවීම්(කොටස් හෝ මුළුමනින්) යනාදි කාරණා සීමාකිරීමකින් තොරව ඇතුළත් කර මා විසින්/අප විසින් දැනට හෝ මෙතැන්සිට නඩත්තු කරනු ලබන සියලු ගිණුම් සම්බන්ධව සහ ඃ

2. මිලදී ගැනීම, විකිණීම **හෝ** කොටස් ,තොග ,බැඳුම්කර හෝ සුරකුම්පත්හි වෙනත් ස්වභාවයක් හා සම්බන්ධ වෙනත් කවර හෝ ආකාරයක කුමන හෝ ගනුදෙනු සම්බන්ධයෙන් ,

පහතින් දැක්වෙන ක්‍රමවේද හරහා ලිඛිත හෝ වාචික සන්නිවේදන මාධ්‍යයන්ගෙන් විශේෂිත ගිණුම/ගිණුම් හෝ කොටස්, තොග හෝ සුරකුම්පත් හි වෙනත් ස්වරූපයන්හි (සමූහාර්ථයෙන් ගත්කළ බලයලත් පුද්ගලයා/පුද්ගලයින්ගේ) මෙහෙයුම් කටයුතු පාලනය කරන, මැන්ඩේටය/උපදෙස්/ගිවිසුම හරහා මා/අප වෙනුවෙන් කටයුතු කිරීමට, බලයලත් නිලධාරීන් මඟින් මා/අප විසින් ලබාදී ඇති කුමන හෝ උපදෙසක් අනුව කටයුතු කිරීමට, හා ඒවා පිළිගැනීමට මම/අපි එල්.ඕ.එෆ්.සී වෙත බලය පවරමි.

(අ) රහැන්ගත සම්ප්‍රේෂණ ( විශේෂිත කේතයක් හරහා සහ එල්.ඕ.එෆ්.සී ආයතනය වෙත ෆැක්ස් සම්ප්‍රේෂණය කරන විශේෂිත ක්‍රමවේදය) සහ

(ආ). දුරකථනය හරහා සිදුවන වාචික සන්නිවේදනයන් සහ

(ඇ). මා/අප බලයලත් පුද්ගලයා/පුද්ගලයින් විසින් අත්සන් තබා ඇති බවට පැහැදිලිව පෙනෙන පරිදි ෆැක්ස් යැවීම මඟින් හා

(ඈ). ඊ-මේල් යැවීම

2. වගන්ති අංක ඉ-2 (සමූහාර්ථයෙන් ගත්කළ සන්නිවේදනයන් ලෙස දැක්වෙන ) හි දැක්වෙන පරිදි මා විසින්/අප විසින්/බලයලත් නිලධාරියා/නිලධාරීන් විසින් ලබා දී ඇති හෝ ලබාදෙනු ඇතැයි අපේක්ෂා කරන ලද උපදෙස් හා පදනම්ව එල්.ඕ.එෆ්.සී ආයතනය විසින් සිදුකරන ගනුදෙනු මාගේ/අපගේ අධිකාරය/දැනුම හෝ අනුමතිය සහිතව හෝ රහිතව සිදු කළද එල්.ඕ.එෆ්.සී ආයතනය විසින් ඉල්ලා සිට ඇති පරිදි එකී ගනුදෙනුව එම කාල සීමාව තුළදී එකී ආකාරයෙන් සම්පූර්ණ කිරීමට මා/අප බැඳී සිටින බවට මම/අප එකඟවෙමි/එකඟවෙමු.

3. ඉහත සඳහන් සන්නිවේදන මාධ්‍යයන් හරහා සිදුකරන ඕනෑම ගනුදෙනුවක් සම්බන්ධයෙන් ලබාදෙන උපදෙස් මාගේ/අපගේ ගිණුමට තැබෙන බැව් ද එම තැරැව්කරුවන් හෝ නියෝජිතයින් තෝරාගැනීම සම්බන්ධයෙන් පූර්ණ අභිමතය එල්.ඕ.එෆ්.සී ආයතනය සතු බැවින් ඇති  එම අවධානම් දැරීමටද එකී තැරැව්කරුවන් හෝ නියෝජිතයින් විසින් සිදුවන කවර හෝ ක්‍රියාවක්,මඟහැරීමක්, නොසලකා හැරීමක් හෝ පැහැරහැරීමක් සම්බන්ධයෙන් එල්.ඕ.එෆ්.සී ආයතනය වගවිය යුතු නොවන බවට මම/අපි එකඟවෙමි./එකඟවෙමු.

4. මා/අප හෝ බලයලත් පුද්ගලයා /පුද්ගලයින් හැර වෙනත් පුද්ගලයෙකුගෙන් ලැබෙන සන්නිවේදනයන් අනුව ක්‍රියා කිරීම නිසා හෝ එල්.ඕ.එෆ්.සී ආයතනය වෙත ෆැක්ස් මඟින් කූට ලෙස යොමුකරනු ලැබෙන මාගේ/අපගේ අත්සන් සහිත උපදෙස් පිළිබඳව එල්.ඕ.එෆ්.සී ආයතනය විසින් එම එවනු ලබන පුද්ගලයා/පුද්ගලයින් විශ්වාස කරමින් මා/අප/ බලයලත් නිලධාරියා/නිලධාරීන් දැනුවත් කරමින් යහ චේතනාවෙන් යුතුව සිදු කරන සහ  දැරීමට සිදුවන කුමන හෝ පාඩුවක් සම්බන්ධයෙන් හෝ අදාළ ෆැක්ස් පතෙහි දැක්වෙන තොරතුරු සත්‍ය හා වංචනික නොවන ඒවා වන අවස්ථාවලදී එල්.ඕ.එෆ්.සී ආයතනය වගනොවන බවට ඉහත කී කොන්දේසිවල පොදු භාවයට අගතියක් නොවන පරිදි මම/අපි එකඟවෙමි/එකඟවෙමු.

5. යැවිය යුතු මුදල් ප්‍රමාණය, කුමන හෝ සුරකුම්පත් ප්‍රමාණයක් මිලදී ගැනීම සඳහා අවශ්‍ය වන මුදල් ප්‍රමාණය, තැරැව්ගාස්තු, මුද්දර ගාස්තු සහ ඒ නිසාවෙන් ඇතිවන වෙනත් එවැනි ගාස්තු සඳහා අවශ්‍ය වන  මුදල් ප්‍රමාණය අන්තර්ගත කරගනිමින් මාගේ/අපගේ සන්නිවේදනයන්ට අදාළව ඇතිවන සියලු මුදල් ඉල්ලුම්, ගාස්තු, අවශ්‍යව ඇති අයකිරීම් හෝ සහ ගනුදෙනු ක්‍රියාත්මක කිරීම සඳහා එල්.ඕ.එෆ්.සී ආයතනය වෙත ගෙවීම් කටයුතු කිරීමට මම/අපි කටයුතු කරමි/කරමු. තවද, එම ගාස්තු මාගේ/අපගේ එල්.ඕ.එෆ්.සී ගිණුමෙන්/ගිණුම්වලින් හෝ මාගේ/අපගේ කවර හෝ ගිණුමකින් හර කර ගැනීමට අවලංගු කළ නොහැකි අධිකාරී බලයක් එල්.ඕ.එෆ්.සී ආයතනය සතුවේ.

6. මා හා/අප හා අවසන් වරට තොරතුරු සන්නිවේදනය කළ එල්.ඕ.එල්.සී හි ලිපදිංචි කර ඇති ලිපිනය වෙත සන්නිවේදනය කරනු ලබන ඕනෑම ගනුදෙනු උපදෙසක් මා හට/අප හට නිසි පරිදි ලැබී ඇති බැව් සළකනු ලැබේ. ගනුදෙනුව සිදුකර දින 7 ක් ඇතුළත එල්. ඕ.එෆ්. සී විසින් මාගෙන් /අපගෙන් විෂමතාව පිළිබඳ වාර්තාවක් නොලැබුනේ නම් අදාළ ගනුදෙනුව මා/අප විසින් තහවුරු කර ඇති බවට සළකනු ලැබේ.

7. මාගේ/අපගේ ගිණුමෙන්/ගිණුම්වලින් බලයලත් පුද්ගලයා/පුද්ගලයන් සන්නිවේදනය අරඹා තිබේද නැද්ද යන්න දැනගැනීම සඳහා එම පුද්ගලයින් ඇමතීමට එල්.ඕ.එෆ්.සී ආයතනයහට පූර්ණ අභිමතය ඇත.